# ඇබෑර්තු දැන්වීමයි

## සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය

## පුරප්පාඩු ලේකම් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පුරප්පාඩු වී පවතින ලේකම් තනතුර සඳහා මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචි සුදුසුකම්ලාභීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරට අදාළ සුදුසුකම්**

(අ) සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / කළමනාකරු - 1 (ස.ණ.ස. සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල්) තනතුරක / ගිණුම් සහකාර තනතුරක වසර 10 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

හෝ

(ආ) මාස 09 ට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත මානව සම්පත් කළමනාකරණය / ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් වීම සමග සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරී තනතුරක වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම/ ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / කළමනාකරු - 1 (සණ.ස. සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 02 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 02ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ගිණුම් සහකාර තනතුරක වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම

හෝ

(ඇ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 04 කින් සමත් වීම (පැරණි නිර්දේශය) / විෂයයන් 01 කට සම්මාන සහිතව විෂයයන් 03 කින් සමත් වීම (නව නිර්දේශය) / සමුපකාර උසස් පෙළ සමත් වීම

හෝ

(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සමත් වී තිබීම.

**I. වැටුප් හා දීමනා**

- වැටුප් පරිමාණ අංකය - SL - 04:02
- වැටුප් පරිමාණය - 27,000 - 540 × 10 - 810 × 10 - 1,080 × 10 = 51,300/-
- වැටුපට අමතරව මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනා හිමි වේ.
- තම කාර්ය සාධනය අනුව ආකර්ෂණීය දිරි දීමනා සඳහා හිමිකම් ඇත.

**II. වයස් සීමාව**

වයස් සීමාව අවු. 18 - 45 අතර

**III. පොදු කරුණු**

- අයදුම්කරුවන් මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන් විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් ඉටු කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත පුද්ගලයින් විය යුතුය.
- ලේකම් තනතුර පිළිබඳ ලබා ඇති පුහුණුව විශේෂ සුදුසුකමක් වනු ඇත.
- පරිගණක දැනුම හා ඉංග්‍රීසි දැනුම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**IV. අයදුම්පත් යොමු කිරීම**

- අයදුම්පත් මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 2/2011 චක්‍රලේඛයේ සඳහන් ආකෘතියට අනුව සකස් විය යුතුය.
- 2/2011 චක්‍රලේඛනය අනුව සකස් කළ අයදුම්පත් සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පලාපත්වල පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් ද ලබාගත හැකිය.
- අසම්පූර්ණ හා අයදුම්පත් භාර ගැනීමේ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, පදිංචිය සනාථ කිරීමේ සහතිකය, ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය යන සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024.06.21 දින වේ.

ඉහත සඳහන් ලේකම් තනතුරට ඔබත් සුදුස්සෙක් නම් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත ලිපිනයට අයදුම්පත් භාර ගැනීමේ දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.

**ගරු සභාපති,**
**සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය,**
**පලාපත්වල, මාතලේ. 2024.06.03**
**066-2220335 / 2220333 / 2220383**